# COLOMBO TEA TRADERS' ASSOCIATION

**THE OFFICE OF THE CTTA, No. 50, NAVAM MAWATHA, COLOMBO 02.**

**Telephone: 5588848, 5588849; Facsimile: 2449352; E-mail; hemaratne@ctta.lk , nisansala@ctta.lk**

චක්‍රලේඛ අංක. 31 of 2023 2023 නොවැම්බර් 17

**කොළඹ තේ වෙන්දේසියට සම්බන්ධ සියලුම සහභාගිවන්නන්හට දැනුම්දීම**

**අනුකූලතාවයට මඟ පෙන්වීම**

ලංකා වානිජ මණ්ඩලය විසින් නියම කර ඇති රෙගුලාසිවලට අනුව, ප්‍රසිද්ධ වෙන්දේසි මගින් තේ විකිණීම සඳහා වන අතුරු නීති සහ කොන්දේසි, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමයේ චක්‍රලේඛ මගින් කලින් කලට කරන ලබන සංශෝධන පරිදි ඩිජිටල් තේ වෙන්දේසිය පවත්වනු ලබයි.

CTTA කාර්යාලය විස්තීරණ නිරීක්ෂණ පද්ධතියක් හරහා නිෂ්පාදකයින්, තැරැව්කරුවන් සහ ගැනුම්කරුවන් යන සියලුම ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ගනුදෙනු සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම්වල සම්පූර්ණත්වය කඩිනමින් සහ අඛණ්ඩව අධීක්ෂණය කරනු ලබයි. මෙම සුපරීක්ෂණ හා අධීක්ෂණ ක්‍රියාවලියට පහත සඳහන් අංග ඇතුළත් වේ:

**1. අධීක්‍ෂණය සහ තාක්‍ෂණය**: ඔන්ලයින් තේ වෙන්දේසියේ ක්‍රියාකාරකම් සමීපව නිරීක්ෂණය කිරීම සඳහා කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය මගින් උසස් දත්ත තීක්ෂ්ණ බුද්ධි මෙවලම් භාවිතා කරනු ලබයි. ස්ථාපිත අතුරු ව්‍යවස්ථා/චක්‍රලේඛවලින් යම් අක්‍රමිකතා සහ/හෝ අපගමනයන් හඳුනා ගැනීමට මෙන්ම අසාමාන්‍ය/සැක සහිත/වැරදි පරිශීලක හැසිරීම් සහ/හෝ රටා නිශ්චිතව හඳුනා ගැනීමටද මෙම මෙවලම් උපකාරී වේ.

**2. e-Platform වෙත ප්‍රවේශය**: සියලුම පරිශීලකයින්ට e-Platform වෙත ප්‍රවේශ වීම සඳහා වරින් වර සංශෝධනවලට යටත් වන පරිශීලක ගිවිසුම විද්‍යුත් වශයෙන් පිළිගැනීම මත රඳා පවතින බව මතක් කර දෙනු ලැබේ. එම ගිවිසුම තුළ ඇති නියමයන් නිරවද්‍ය වන අතර, කිසියම් කඩකිරීම්, උපාමාරු හෝ අක්‍රමිකතා නිරීක්ෂණ කණ්ඩායම විසින් සියුම් ලෙස නිරීක්ෂණය කරනු ඇත.

**3. උල්ලංඝනය කිරීම් සඳහා ප්‍රතිවිපාක**: කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය විසින් e-Platform වෙත ප්‍රවේශ වීම සඳහා නිකුත්කල පරිශීලක ගිවිසුම හෝ අතුරු ව්‍යවස්ථා හෝ චක්‍රලේඛ උල්ලංඝනය කරන්නන් සඳහා පනවනු ලබන දඬුවම්වල බරපතලකම අවධාරණය කරනු ලැබේ. කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය කොළඹ තේ වෙන්දේසියේ කීර්ති නාමය ආරක්ෂා කිරීමට කැපවී සිටින අතර, ඕනෑම උල්ලංඝනයක් ඉතා බරපතල ලෙස අඛණ්ඩව සලකනු ලබන අතර, වෙළඳපොළ හැසිරවීමට සාමූහිකව ක්‍රියා කරන එම පාර්ශවයන්ගේ විද්‍යුත් වේදිකාව භාවිතා කිරීමේ අයිතිය ප්‍රතික්ෂේප කිරීම ඇතුළුව අත්හිටුවීමට/දඬුවම්වලට තුඩු දෙනු ඇත.

**4. සාධාරණත්වය සහ පාරදෘශ්‍යභාවය තහවුරු කිරීම**: සියලුම ගනුදෙනු සාධාරණව සහ විනිවිදභාවයෙන් සිදු කෙරෙන බව සහතික කිරීම සඳහා තේ වෙන්දේසිය තුළ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට සංගමය කැපවී සිටී. කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය විසින් මෙම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සියලුම සහභාගිවන්නන්ගෙන් පූර්ණ අනුකූලතාවයක් ඉල්ලා සිටී.

**5. පාර්ශවයන්ගේ සහයෝගීතාව**: කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය සියලු පරිශීලකයින්ගේ සහයෝගීතාවය සහ අවබෝධය බෙහෙවින් අගය කරන අතර වැඩිදුර පැහැදිලි කිරීම් අවශ්‍ය නම් CTTA කාර්යාලය සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන ලෙස දැණුම් දෙමු.

මෙම දැනුම්දීම කොළඹ තේ වෙන්දේසියේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීමට සහ මෙම උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාමට ප්‍රමුඛත්වය දීමට අතිශය වැදගත්කමක් දක්වන **පාර්ශවයන්** පෝෂණය කිරීම අරමුණු කර ගෙන සිදුකර ඇත.

මෙම චක්‍රලේඛයේ සිංහල සහ ඉංග්‍රීසි පාඨ අතර කිසියම් නොගැලපීමක් ඇති වුවහොත් ඉංග්‍රීසි පාඨය බලපැවැත්වේ

**CTTA කාර්යාලය**
**කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය**